ජපානයේ රැකියා සිහිනය සැබෑකර ගැනීමට ඔබට අනගි අවස්ථාවක් !

විශේෂිත නිපුණතා සහිත ශ්‍රමික වැඩසටහන (SSW)
හෙද සත්කාරක සේවා ක්ෂේත්‍රය (කාන්තා / පිරිමි)

විශේෂිත නිපුණතා සහිත ශ්‍රමික වැඩසටහන (SSW) යටතේ ජපානයේ හෙද සත්කාරක සේවා කර්මාන්තයේ රැකියා ඇබෑර්තු සඳහා අයදුම්කරුවන් දැනුවත් කිරීමේ හා බඳවාගැනීමේ වැඩසටහනක් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ දී පැවැත්වේ.

ඒ සඳහා පහත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් අදාළ සහතිකපත් හා එහි ඡායාපිටපත් ද සහිතව 2026.10.26 දින පෙ.ව.9.00 ට අංක 234, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත, බත්තරමුල්ල ලිපිනයේ පිහිටි ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ ප්‍රධාන කාර්යාලයේ ශ්‍රවණාගාරය වෙත පැමිණෙන්න.

(සැ.යු.මින් පෙර ජපානය සඳහා වීසා අයදුම්කර ප්‍රතික්ෂේප වී ඇති අයදුම්කරුවන් මේ සඳහා අයදුම් කිරීමෙන් වලකින්න)

අවශ්‍ය මූලික සුදුසුකම්.

- වයස අවු.18 - 35 අතර විය යුතුය.
- අ.පො.ස (උ.පෙළ) විභාගය සඳහා පෙනී සිට තිබිය යුතුය. (රජයේ හෝ පෞද්ගලික පාසලක වසර 13 ක අධ්‍යාපන කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.)
- ජපන් භාෂා ප්‍රවීණතා විභාග JLPT N4 හෝ JFT විභාගය සමත් වීම (A2.2) හෝ ඊට ඉහළ සුදුසුකම් තිබිය යුතුය.
- රැකියා ක්ෂේත්‍රයට අදාල කුසලතා පරීක්ෂණය සමත් විය යුතුය. (හෙද සත්කාරක සේවා ක්ෂේත්‍රයට අදාල කුසලතා පරීක්ෂණය සමත් විය යුතුය.)
- උස - කාන්තාවන් සඳහා 150 cm හෝ ඊට වැඩිවිය යුතු අතර පිරිමි සඳහා 160 cm හෝ ඊට වැඩිවිය යුතුය
- බර - කාන්තාවන් සඳහා 40 Kg හෝ ඊට වැඩිවිය යුතු අතර, පිරිමි සඳහා 50 Kg හෝ ඊට වැඩිවිය යුතුය
- ශරීරයේ Tattoos නොතිබිය යුතුය.
- දැඩි ආබාධ නොතිබිය යුතුය.

අවශ්‍ය ලිපිලේඛන.

- සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය (අයදුම්පත්‍රය ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ www.slbfe.lk වෙබ් අඩවියේ පලකර ඇත)
- පාසැල් හැරයාමේ සහතිකය
- අ.පො.ස (උ.පෙළ) ප්‍රතිඵල සහතිකය
- ජාතික හැඳුනුම්පත
- ගමන් බලපත්‍ර පිටපත
- කුසලතා පරීක්ෂණ සහතිකය
- JFT හෝ JLPT N4 සහතිකය

වැඩි විස්තර සඳහා 1989 අමතන්න

(බඳවාගැනීම ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙන් පමණි.)

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය